# නලින් සමරකෝන්
# *Nalin Samarakoon*

ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්, දිවුරුම් කොමසාරිස් හා සමාගම් ලේකම්
**Attorney-At-Law, Notary Public & commissioner for Oaths, Company Secretary**


2024.01.04

වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා,
නො. 223/12 A,
උයන පාර, ලුනාව,
මොරටුව.

මහත්මයාණෙනි,

මාගේ සේවාදායකයකු වන මොරටුව, බිෂොප් ටෙරස්, අංක 12/2 A හි පදිංචි නීතිඥ දම්පැල්ල ගමගේ රවින්ද්‍ර මනෝජ් කුමාර මහතාගේ උපදෙස් මත මෙම ලිපිය ඔබ වෙත එවමි.

මාගේ සේවා දායකයා වසර 20ක කීර්තිමත් වෘත්තීය ඉතිහාසයක් ඇති ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥවරයෙකු වන අතර ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කලෙක රූපවාහිනී නාලිකා කීපයක ප්‍රසිද්ධ ප්‍රවෘත්ති නිවේදකයකු ලෙස ද කටයුතු කර ඇත. තවද වසර 20 ක් පමණ ජනතා ආදරය දිනාගත් සිවිල් හා දේශපාලන ක්‍රියාකාරිකයකු ලෙස ද ඔහු කටයුතු කරමින් සිටී.

තවද වසර 20 ක වෘත්තීය ඉතිහාසය තුළ වසර 19ක්ම ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ කවුන්සලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති ඔහු වසර දහයක කාලයක් මොරටුව නීතිඥ සංගමය ලේකම්වරයා ලෙසද වසර හතරක් එකී සංගමයේ සභාපතිවරයා ලෙසද ක්‍රියා කර ඇත.

ඔබ විසින් වර්ෂ 2023 /12/ 29 වන දින කොළඹ ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස ඔබගේ නිල කාමරය තුළ පොදු දේපළ ද අවභාවිතා කරමින් මාගේ සේවා දායකයා හට වෛද්‍යවරයෙකුට තබා කිසිදු උගත් පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තු නොවන ආකාරයේ ඉතාමත් අශීලාචාර, අසභ්‍ය, අශෝභන හා අප්‍රසන්න වචන භාවිතා කරමින් ඔහුව නිර්දය ලෙස විවේචනය කරමින් මහජනතාව තුළ ඔහු කෙරෙහි ද්වේශයක්, අප්‍රසාදයක් සහ පිළිකුලක් ඇති කරවන ආකාරයෙන් ද්වේශ සහගත ලෙස මෙම රටෙහි සියලු ප්‍රසිද්ධ ජනමාධ්‍ය සහ යූටියුබ් නාලිකා ඉදිරියේ අදහස් ප්‍රකාශ කිරීමක් සිදුකර ඇත.

එකී ජනමාධ්‍ය සාකච්ඡාවේදී වෙනත් කරුණු අතර "මේ ලෝයර් ජාතික ඖෂධ අධිකාරියේ ඉද්දි කාන්තා ස්ත්‍රී දූෂණ වැඩවලටත් සම්බන්ධයි කියලා අපි දන්නවා. ඒ උනාට ක්‍රියාමාර්ග ගත්තෙත් නෑ" යනුවෙන් ඉතාමත් සාවද්‍ය බරපතල සහ ද්වේශ සහගත අසත්‍ය ප්‍රකාශයක් කරමින් මාගේ සේවාදායකයාගේ කීර්ති නාමයට, චරිතයට අපහාසාත්මක ප්‍රකාශයක් සිදු කර ඇත.

ඔබ විසින් කළ එකී අසත්‍ය ප්‍රකාශයෙන් පසුව සමාජ මාධ්‍ය ඔස්සේ සහ youtube නාලිකා කිහිපයක් ඔස්සේ "රුක්ෂාන් බෙල්ලන ආයෙත් කට අරී... මනෝජ් ගමගේට ස්ත්‍රී දූෂණ චෝදනාවක්" වැනි ශීර්ෂයන් යටතේ මහජනතාව අතර ප්‍රචාරය වීමද සිදුවී ඇත. ඒ අතරින් නිව්ස් සෙන්ටර් (news center) නම් 375,000 ග්‍රාහක පිරිසක් සිටින්නා වූ යූටියුබ් නාලිකාවක් මෙන්ම වොයිස් ටියුබ් (Voice tube) නමින් 384,000 පිරිසක් සිටින youtube නාලිකාවක මෙකී ඔබගේ අසත්‍ය චෝදනාව ඇතුළත් වීඩියෝව පැය 24කට ආසන්න කාලයකදී නැරඹුම් වාර 30,000ක අධික ප්‍රමාණයක් ප්‍රචාරය වී ප්‍රසිද්ධ වී ඇත.


391/4/2, 4th Floor, Dram Steer, Colombo 12 .
Tel –077 634 0080/072 8000635, email –ewsnalin@gmail.com

ඔබ විසින් ඉතාමත් ද්වේශ සහගතව මාගේ සේවාදායකයා හට ස්ත්‍රී දූෂකයෙකු ලෙස මහජනතාව නොමග යවමින් කර ඇති අසත්‍ය ප්‍රචාරය වීම මඟින් විවාහක දෙදරු පියකු වන මාගේ සේවා දායකයාගේ පවුලේ සාමාජිකයින්ට මෙන්ම විශේෂයෙන්ම පාසල් යන දරුවන් දෙදෙනාට සමාජය ඉදිරියේ දැඩි අපහසුතාවයක් ඇතිවීම මත මෙන්ම කීර්තිමත් නීතිඥවරයෙකු වශයෙන් තම සේවාදායකයන් ඉදිරියේ සහ සිවිල් හා දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙස දෙස් විදෙස් ඔහුගේ අනුගාමිකයන් හා වෘත්තීය සගයන් අතර අපකීර්තියට පත්වීම මතද මාගේ සේවාදායක දැඩි ලෙස මානසික පීඩාවකට හා කම්පනයකට පත්වී ඇත.

විශේෂයෙන්ම මහජනතාව ඉදිරියේ යහපත් හා කීර්තිමත් චරිතයකට හිමිකම් කියූ මාගේ සේවාදායක මෙකී අසත්‍ය ද්වේශ සහගත ස්ත්‍රී දූෂණ චෝදනාවක් හමුවේ සමාජය ඉදිරියේ දැඩි අපහසුතාවයකට සහ අපකීර්තියට පත්වී ඇත.

ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා මෙන්ම වෛද්‍යවරයෙකු ලෙස ඔබගෙන් කිසි ලෙසකින්වත් බලාපොරොත්තු විය නොහැකි අශීලාචාර සහ අසභ්‍ය වචන භාවිතා කරමින් මාගේ සේවාදායකයා හට සම්පූර්ණයෙන් අසත්‍ය නිර්මාණය කරන ලද ස්ත්‍රී දූෂණ චෝදනාවක් වැනි බරපතල අපරාධ චෝදනාවක් එල්ල කිරීම මඟින් ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයකු ලෙස මෙන්ම වගකිවයුතු රජයේ තනතුරු ගණනාවක් උසුලන මාගේ සේවාදායක පොදු මහජනතාව ඉදිරියේ අපකීර්තියකට, අපහාසයකට, ද්වේශයකට පිළිකුලකට, වෛරයකට, අපහාසයකට ලක්වීම හේතු කොට ගෙන මාගේ සේවාදායකයාගේ කීර්ති නාමයට සිදු කළ හානිය රුපියල් මිලියන 500කට තක්සේරු කර සිටින අතර, මෙම ලිපිය ලැබී දින 7 ක් ඇතුළත එම මුදල ගෙවන ලෙස මෙයින් ඔබ වෙත දන්වා සිටිනු ලබන අතර ඔබ එකී මුදල ගෙවීම පැහැර හැරියොත් හා හෝ නොසලකා හැරියහොත් නිසි බලය ඇති අධිකරණයක් ඉදිරියේ නඩු පවරා එකී මුදල ඔබගෙන් අය කර ගැනීම සඳහා මාගේ සේවාදායක මා හට වැඩිදුරටත් උපදෙස් ලබා දී ඇති බව මෙයින් ඔබ වෙත දන්වා සිටිමි.

මෙයට - විශ්වාසී,

නීතිඥ නලින් සමරකෝන්

NALIN SAMARAKOON
Attorney-at-Law,
Notary Public, Commissioner for Oaths
& Company Secretary
No. 391/4/2, 4th Floor, Dam Street, Colombo-12.
Tel : 077 6340080